## දෙනෙත් මෙන් රැක ගනිමු



අහෝ කීයක් නම්
ළමා දින
පසු කරන්නට ඇතිද
අප හැම

එහෙත් ළමුනට
ඉන් සෙතක් නම්
නොමැත සිදු වී
එයයි කරුමය

දිනෙන් දින
වැඩි වේය ළමුනට
සිද්ද වන අපරාධ
හැම අත

ජාත්‍යන්තර ළමා දිනය යැයි
එක් දිනක් වෙන් කල සඳ
සොයයි සිදු වන අවැඩ ළමුනට
එහෙත් එය එක් දිනකි හැමහට

අහෝ කවුරුද
කවරදාක ද
දෙන්නේ සැබෑ
විසඳුමක්

එම නිසා මව්වරුනි
හැම කල්
දෙනෙත් මෙන්
රකිමු දරුවන්

තනූජා වෙන්ඩකෝන්
Ardeer

## සුදු පාවඩ මෙනි ඔබේ හදවත

සුදු පාවඩ දමා ඔබ ගෙන යන්නට
වත්කම් නැත මට මගෙ සුදු නෑනේ
සුදු පාවඩ මෙනි ඔබේ හදවත
මට කුමටද රජ මගුල් නගේ

රජ සැප විඳි නිලමෙගෙ දෝනී
සුදු පාවඩ මත දීග ගියත් නගේ
මැදුරේ තනි වී කඳුලු හෙලයි ඈ
විරසක වී ඈ ගිය රජ දීගේ

මුදලට බලයට යට වෙන දීගේ
කඳුලින් පිරි මහ සයුර වගේ
පුංචි පැලේ අප ගෙන යන දීගේ
සැපයෙන් සැපයකි මට සැමදා නෑනේ

නොයෙල් පෙරේරා

## කඩුපුලේ සුවඳ

සිතක් දෙතැනක නතර වේ නම්
සිහිනය සැබෑ නොම වේ නම්
ආත්මීය බැඳීම් සදාකාලික නම්
කිමැයි ආදරේ අරුමය?

දෙසිතම එකම සිතක් නොම වුවත්
සඳ තරු කඩා වැටුණත්
අසපුවේ කවුලු පියන් පත් වැසුණත්
කඳුලු මන්දාරම් ගලා හැලුණත්
මා ඉකි ගසා ඇඬූ බව
ඔබ දන්නේ නෑ
බොළඳ මගේ සිත

ගිළිහුණ දා මතකයෙ මල්දම්
විරහයක් විය ඔබ පැළඳූ රන්දම්
මුණ ගැහුණොත් පෙම් රුව යළි සිත්තම්
ගොළු වේවිද හද පිදූ මල්කම්

මතකයෙ සෙනෙහස තුරුළු කරන්
ආදර දෙවොලේ සුවඳ අරන්
පෙම් රජ දහනේ ඔටුනු අරන්
මං එනවා කඩුපුලෙ සුවඳ අරන්

කාන්ති වික්‍රමසූරිය

## අසිත පුතුට

කිරි සුවඳයි නුඹ ළඟ තාමත්
ලොකු පුතේ මගේ ලොකු පුතේ
උකුලට ඇවිදින් නැළවියන් පුත
නුඹ පුංචියි මට තාමත්

දැවටී දැවටී දෙඩූ බස් නැත
ලොකු වෙලා නුඹ ලොකු වෙලා
අදත් එදා මෙන් අහන්න ආසයි
සුරතල් නුඹේ කතා
සුදු පුතේ මගේ සුදු පුතේ

දැයට වැඩක් ඇති
පුතෙක් වෙයං පුත
කොහොම වුණත් නුඹ
මගේ ගෙදර දොර
නුඹට ඇරී ඇත
ලොකු පුතේ මගේ ලොකු පුතේ

හේමමාලි
මෙල්බන්



සංස්කරණය
තුෂාරි ප්‍රියංගිකා

## ඇට්ටේරියා මල්

සියුම් පහසකට වුව
කිළිපොලා සියොලඟම
සිපගනියි වෙන වෙනම
තණපත් නොපමාව

ප්‍රශංසනී පරණවිතාන

## තිළිණය

මිණි කිරුළු පැළැන්දෙමි
රන් සිහසුන මත හිඳ
තිස් වසරකට පෙර
බිළිඳු දියණිය
උපත ලැබූදා

පිවිසියෙමි අද මා
සැත්කම් හල වෙත
රෝද ඇඳ මත වැතිර

මුකවාඩම් බැඳි හැම
අනුකම්පා දෑසින්
දොඩති මා හා
එමගින් කම් නැත

මට යාබද සැත්කම් හලේ
වැතිර සිටිනා මගේ
බෑණනුවන්හට තිළිණ කරමි
වම් වකුගඩුව

මහ මෙරටත් වඩා
උසය දරු පෙම

ලක්ෂ්මී ගුණරත්න



## ගායකයා හා යුවතිය

නගර උද්‍යානයේ ජනී ජනයා අතර
මාරගස් පෙළ අසල ගයමි ගී නිරතුරුව

ඔබ ඇවිත් හිඳ ගනී එකම එක වෙලාවට
දිරාගිය බංකුවේ කෙළවරක හැමදාම

ගයමි මම අබිමනෙන් පියාගෙන යුග නුවන
ඔබ ගැනම සිත යොමා බැඳුණු ගීයක් ලෙසින

ඔබේ නුවනග කැලුම ගීය ලෙස මතුව එයි
ඔබේ පියකරු වුවන ගී තනුව හා ගැටෙයි

නුවන මා නොගැටුණත් ඔබේ දෙනුවන සමග
දැනේ මට ඔබේ මුව මගේ දෙනයන ගැටෙන

පිවිතුරුම ගීතයයි ගැයෙන්නේ මා මුවින්
කිසි විටෙක ඔබට නොහඟවන පද පෙළ තුළින්

පාලිත ගනේවත්ත

## විඳින්න ජීවිතේ සතුට

රකින්න ගරුත්වය අන් අයගේ
රැකෙයි තම ගරුත්වය පිවිතුරුව
පවසන්න මුදු වදන් සැම විට
නොඇසේවි රළු වදන් සවනට
නොරිදන්න අන් අයගෙ සිත්
රැඳෙයි සිත සතුට හැමදාම
නොනගන්න කඳුළක් කිසිවකු ඇසට
රැඳෙයි හසරැලි මුව අග
දක්වන්න ආදරය කරුණාව
ලැබෙයි නොඅඩුව ආදරය පෙරලා
විඳවන්න එපා ජීවිතය
හැකි වෙයි විඳින්න
ජීවිතේ සතුට

කාන්ති ගලප්පත්ති
කැන්බරා

දෑතේ මුදු ඇඟිලි තුඩු තැතිගෙන පිරිමදිමි
මලක මුදු පෙති ලෙස සියුම් යැයි සිතූ බැවින්
දෝතට ගෙන ඔබ දෙපා යුග පිරිමදිමි
මා ඇකයේ දැවටුණු බිළිඳෙකු යැයි සිතා
සසැලුන සිත් ඇතිව දෙනෙත් ඔබ සිප ගතිමි
සමනළ තටු ලෙසින් පෑරේ යැයි සිතා
මා ලයේ උණුසුමට සෙමින් ඇරයුම් කළෙමි
හදවතේ ගැස්මට ඔබ බිය වෙයි සිතා
කාලයේ වියැකෙයි ඒ සියළු මතකයන්
ඔබ හදවතට කොඳුරනු එපා යළි සිහි-
නෙන්වත්
තාරකා නෙත් සඟල කඳුලින් බොඳ නොවන්
මින්මතු කිසිදාක ඔබ පුංචි විශ්වයේ
අද මෙන්ම හෙට දිනත් නොමියෙන සෙනෙහස
දොළොස් මහ පහණක් වේවා ඔබ සිත්
මළුවට

නිරෝෂ් බුද්ධික පෙරේරා
ක්ලේටන්



## -වියත් පන්හිඳ-

*වියත් කවියන් ලොව දකින හැටි අපූරුය... සොඳුරුය... එවන් කවියන්ගේ කවි.... රස විඳින්නටත්, කවිය කුමක්ද යන්නට අර්ථ සපයා ගන්නටත් මහගු අත්වැලක් වනු ඇත. වියත් පන්හිඳ එයට වෑයමකි.*

*මෙවර වියත් පන්හිඳට තෝරා ගත්තේ වසර 50 කටත් වඩා පැරණි කාව්‍ය පංතියකි. ඉන් දෙන පණිවුඩය මෙන්ම කවි රසය අදටත් මොනවට පෑහේ. මෙවැනි කවියන් සහ ඔවුනගේ නිර්මාණ ඇසුරු කිරීමෙන් ඔබේ නිර්මාණශීලීත්වය තව තවත් වර්ධනය කර ගත හැකි වන්නේම ය.*

### නව මැදුර

බිඳ දා පැරණි රජ ගෙය මා තනන ලද
ඉදිවෙයි නවක මැදුරක් ලොව දකින ලෙද
මතු වුණ හැම දිනක මෙන් ගන අඳුර බිඳ
ඒ ගෙට මෙන්ම මේ ගෙයටත් වැටෙයි හඳ

මේ නව මැදුර පෙනෙතත් ඇස එළිය දෙන
පදනම පැරණි වෙයි ඒ මා සැදුව තැන
ඇස රවටනු විනා අගයක් නොමැත වෙන
ජාතික හැඟුම් නැත මෙහි තිබු පළමු දින

කවිතුක රසය දෙන ඉපැරණි දෙයට ලොවේ
බුහුමන් කරති එය බිඳලනු සිරිත නොවේ
ආලෝකය ඇතත් මේ ගෙයි අගය නිවේ
කාලය හඬ හඬා දොරකඩ වැතිර තැවේ

තිබුණත් කලා රසයක් පෙර දිනක මෙහේ
පෙති උළු කැටයකුදු අද නම් දකිනු නොහේ
නව මැදුරේ කුළුණු හිරු රැස් වලට ගැහේ
කොවුලෝ සිනාසෙති මිදුලේ ඇටඹ ගහේ

පෙම්බර පරෙවියෝ කණු මත කැදලි බැඳ
රසවත් වූහ දිව රෑ මෙහි එකට හිඳ
පෙරදා පරිදි එළියක් දෙන නමුදු හඳ
ගීයක් කලාවක් මේ ගෙයි තිබෙන වද

මගෙ අත වෙහෙස වුණ පදනම තිබෙන බිම
ඉදි වූ නිසා ඇස් රවටන මැදුර මෙම
හිරු සඳු එළිය ලැබ දෙයි මොහොතකම හැම
නැත්නම් ගල් ගෙයක් වන බව දනිමි මම

රජ රට අගය වූයේ ලොව කිමද කියා
දන්නෝ දනිති හිතු බැල්මෙන් දෙනෙත පියා
ඉතිහාසය ඇතත් කියවනු පිණිස ලියා
කීයක් වෙහෙසෙද්ද එහි ඇති අගය සොයා

මිදුලේ ඇටඹ ගස ඉපැරණි ගෙයි සිද්දී
කොවුලන් සමඟ හැම උදයෙම පව සද්දී
දෝතළු පුවක් මල් ඇට බිම ඉහි රෙද්දී
ආවා හුළං රැළි ගහ පහළින් ඇද්දී

රැවටිය හැකි පරිදි නෙත් බැලුවෙකුට අද
හිස් වූ කලාවක් පරකාසයට බැඳ
බිඳ දා පැරණි රජ ගෙය මා තනන ලද
ඉදි වෙයි නවක මැදුරක් ලොව දකින ලෙද

මඩවල එස් රත්නායක

## Come, give me a hand, let's go

If you are not dead
Or dying
You have to wake up
When the day breaks
Every morning is fresh
Although not in a dew on a petal
Wipe the dust on your bruised forehead
Come, give me a hand, let's go
Forget the boghtmares of blood
Tread soft on wreck
There's a brook of fresh life
Somewhere in the land
Forget we were defeated
What is the meaning of success?
Life is minutes, day and years
Come, give me a hand, let's go

**Ajith Perakum Jayasinghe,**